**මිහින්තලේ ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

**01. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 අහිතකර මතය**
**------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) උතුරුමැද පළාත් භාණ්ඩාගාරයෙන් ඉදිරිපත් කර තිබුණු වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුළ සභාව වෙත අයවිය යුතු රු.763,329 ක උසාවි දඩ ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.775,340 ක්වූ වත්කම් විෂයයන් 03 ක් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාවේ පුස්තකාලය හා ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් 2012 වර්ෂයේදී සභාව වෙත ලැබී තිබුණු රු.3,958,710 ක ණය මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛණය අනුව සභාව සතු ප්‍රධාන ගොඩනැගිලි 02 ක වටිනාකම රු.24,342,542 ක් වුවත් එම වටිනාකම ගොඩනැගිලි 03 ක් ලෙස සහ රු.40,878,012 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.16,535,470 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සභාව සතු කඩ කාමර 78 ක් සමඟ වූ ඉඩම් 06 ක්, පෙර පාසැල් ගොඩනැගිල්ල පිහිටි ඉඩම හා මහජන ක්‍රීඩාංගන ඉඩම සහ දේපලවල වර්තමාන වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.240,000 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.3,349,918 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 වරිපනම් බදු

--------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත්කර එම ප්‍රදේශ තුළ පිහිටියාවූ නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු පනවා, අයකිරීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.2.2 බදුකුලී

---------

(අ) සභාව සතු වෙළඳ ස්ථාන වාර්ෂිකව බදුදීම මත, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට හිඟහිටි බදු මුදල රු.633,000 ක් විය. එම මුදලින් රු565,001 ක් වර්ෂ 10 කට පෙර සිට පවතින හඳුනා නොගත් ශේෂයක් වූ අතර, සියළු බදු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු කඩකාමර බදුගෙන තිබුණු බදුකරුවන් 31 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවිය යුතු හිඟහිටි කඩ කුලී ශේෂය රු.344,430 ක් විය.

#### 2.2.3 උසාවි දඩ

------------

සමාලෝචිත වර්ෂය අවසන් වන විට උසාවි දඩ ආදායම් ලේඛණය අනුව සභාවට අයවිය යුතු හිඟහිටි උසාවි දඩ මුදල රු.1,289,977 ක්වූ අතර, ඉන් රු.654,345 ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. මෙම හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

#### 2.2.4 මුද්දර ගාස්තු

----------------

2013,2014 හා 2015 වර්ෂවලට අදාළව සභාව වෙත අයවියයුතු මුද්දර ගාස්තු ආදායම හඳුනා ගෙන අදාළ ලේඛණවල සටහන් කිරීමට කටයුතු කර නොතිබූ අතර මුද්දර ගාස්තු වෙනුවෙන් පවත්වාගෙන තිබෙන ලේඛණයේද සටහන් ඇතුළත් කිරීම ඉතාමත් අවිධිමත් පරිදි සිදුකර තිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුළ පිහිටි භූමි ප්‍රමාණය අක්කර 121.5 ක්වූ සුසානභූමි 46 ක අයිතිය විධිමත් පරිදි සභාව වෙත පවරා ගැනීමට හා මූල්‍ය ප්‍රකාශනවල අදාළ තොරතුරු අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 75 ක් වෙනුවෙන් රු.10,169,928 ක මුදලක් සභාවට අයවිය යුතුව තිබූ අතර ඒ හා සමාන මුදලක් සභාව විසින් ණයහිමියන් සඳහා ගෙවිය යුතුව තිබුණි. මෙම ශේෂයන් සකස් වූ ආකාරය දැක්වෙන විස්තරාත්මක උපලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) එකතුව රු.143,230 ක්වූ වවුචර්පත් 17 ක් සඳහා සහතික කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය 04 ඡේදය ප්‍රකාරව වර්ෂ 01 සිට 20 කට අධික කාලයක් තිස්සේ සේවකයන් 14 දෙනෙකුගෙන් අයවීමට තිබෙන රු.174,563 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාව සතු වටිනාකම රු.1,880,000 ක්වූ ටැෆේ ට්‍රැක්ටර් රථය හා ජල බවුසර් 02 ක් මෝටර් වාහන පනතේ( 203 වන අධිකාරය) 2(i) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කිරීමකින් තොරව ධාවනයේ යොදවා තිබුණි.

**3.2** **නිශ්ක්‍රිය වත්කම්**

-------------------

රු.2,483,900 ක්වූ වාහන, යන්ත්‍ර හා උපකරණ 11 ක් වර්ෂ කීපයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**3.3** **ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

-------------------------

ඇස්තමේන්තු වටිනාකම රු.3,628,488 ක්වූ ව්‍යාපෘති 07 ක ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණද, 2016 අප්‍රේල් මස වනවිටත් එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් නිම කිරීමට නොහැකි වී තිබුණි.

**04.** **පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය